ZEOM

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

# සුවෙන් පෙරට

# e ඉගෙනුම් පියස

# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

වාරය : 3 වන වාරය

ශ්‍රේණිය :12 ශ්‍රේණිය

විෂයය : ව්‍යාපාර අධ්‍යයනය

පාඩම : විදේශ වෙළෙඳාමේ ආනයන හා අපනයන ක්‍රියාපටිපාටිය

# ව්‍යාපාර අධ්‍යයනය

## 12 ශ්‍රේණිය

**නිපුණතාවය 11**

**නිපුණතා මට්ටම 11.5**



# ආනයන අපනයන වෙළෙඳාමේදී භාවිතා වන ලියකියවිලි

- ආනයන / අපනයන බලපත්‍ර

බලපත්‍ර අවශ්‍ය වන භාණ්ඩ ආනයන අපනයන පාලක ප්‍රසිද්ධියට පත් කරයි. උදා:තේ- ශ්‍රී ලංකා තේ මණ්ඩලය

- ඉන්ඩෙන්ටුව/ඇණවුම(Indent/Order)


ආනයනකරුවෙකු විදේශීය සැපයුම්කරුවකු වෙත යවන මෙම ඇණවුමෙහි අවශ්‍ය භාණ්ඩ පිළිබඳ විස්තර, මිල, නැව්ගත කිරීමට අදාල තොරතුරු ඇතුළත් කෙරේ.විදේශ වෙළෙඳාමේදී මෙම ඇණවුම ඉන්ඩෙන්ටුව ලෙස හඳුන්වයි.

- ඉන්වොයිසිය(Invoice)

අපනයනය කරනු ලබන භාණ්ඩවල විස්තර, මිලගණන්, ගෙවීම් කොන්දේසි, ගමන් මාගර්ය, ප්‍රතික්ෂේප කිරීමේ කොන්දේසි ආදී විස්තර ඇතුළත් ලේඛනයකි.

## ❑නෞභාරපත-(Bill of Lading /B.L)

අදාළ භාණ්ඩ තොගය නැවට භාරගත් බවත්,එම භාණ්ඩ අදාල රටේ වරායට ගෙන ගොස් භාරදෙන බවටත් සඳහන් කර නැව් සමාගමක් වෙනුවෙන් නැව්පති හෝ ඔහුගේ නියෝජිතයෙකු අපනයනකරු වෙත නිකුත් කරන ලියවිල්ල වේ. ආනයනකරුට එම භාණ්ඩවල අයිතිය තහවුරු කිරීමට මෙය අවශ්‍ය වේ.



- ප්‍රභවස්ථාන සහතිකය(Letter of Origin)

නැව්ගත කරන භාණ්ඩ අපනයනය කරන රටේ නිපදවා ඇති බව සහතික කරමින් පිළිගත් වෙළෙඳ මණ්ඩලයකින් හෝ රාජ්‍ය ආයතනයකින් නිකුත්කරන ලියවිල්ලකි. තීරුබදු සහන ලබාගැනීමට මෙම ලියවිල්ල වැදගත් වේ.

- ණයවර ලිපිය(Letter of credit/LC)

ආනයනකරුගේ ඉල්ලීම මත, ආනයනකරුගේ බැංකුව විසින් අපනයනකරුගේ බැංකුව වෙත, අපනයනකරු විසින් ආනයනකරු වෙත අපනයනය කරන භාණ්ඩවලට මුදල් ගෙවීම තහවුරු කිරීමට නිකුත් කරන ලියවිල්ල වේ.

- ආනයන සටහන්කරය(Import Entry)

ආනයනකරු වෙනුවෙන් වරායට ලැබී ඇති භාණ්ඩ පිළිබඳ අයිතිය ප්‍රකාශ කිරීම සඳහා ආනයනකරු හෝ ඔහුගේ නියෝජිතයෙකු රේගුවට ඉදිරිපත්කරන ලියවිල්ල වේ.

- අපනයන සටහන්කරය(Export Entry)

අපනයනකරු අපනයනය කිරීමට අපේක්ෂා කරන භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් කර අපනයනකරු විසින් අපනයන රටේ රේගුවට ඉදිරිපත්කරන ලියවිල්ලකි.

- රක්ෂණ සහතිකය (Insurance Certificate)

අපනයනයට අදාළ භාණ්ඩ තොගය අපනයනය කිරීමේදී එම භාණ්ඩ තොගය රක්ෂණය කර අපනයනකරු හෝ ආනයනකරු ලබාගන්නා සහතිකයයි.

- හානිරක්ෂණ ලිපිය (letter of Indemnity)

දූෂ්‍ය නෞභාරපතක් නිකුත් කිරීමේ තත්වයක් ඇති අවස්ථාවල කැඩීබිඳීම් හෝ පළුදු වීම් ඇති එම භාණ්ඩවල අනාගත සියලු අවදානම් අපනයනකරු භාරගන්නා බව සඳහන් කරමින් පාරිශුද්ධ නෞභාරපතක් ලබාගැනීම සඳහා අපනයනකරුවෙකු විසින් නැවේ කපිතාන් හට නිකුත් කරන ලියවිල්ලකි.

- සනීපාරක්ෂක සහතිකය/සෞඛ්‍ය සහතිකය (Sanitary Certificate/ Health Certificate)

ආනයන රටේ අවශ්‍යතාව මත යම් රටක් අපනයනය කරන ඇතැම් කෘෂි නිෂ්පාදිතවල පාරිභෝගික යෝග්‍යතාවය තහවුරු කරමින් එම රටේ පිළිගත් ආයතනයක් නිකුත් කරන ලියවිල්ලකි.

උදා: කෘෂි නිෂ්පාදන- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

- ගුදම් බලපත්‍රය

වරාය ආශ්‍රිත ගබඩා ගුදම් (warehouse) ලෙස හඳුන්වයි.ගුදමක භාණ්ඩ තැම්පත් කල විට ගුදම් අධිකාරීන් ඒ බව සහතික කරමින් ආනයනකරුට නිකුත් කරන ලියවිල්ලකි.මෙය පැවරිය හැකි ලියවිල්ලකි.

- වේදිකා කුවිතාන්සිය/වාප්පුකාර කුවිතාන්සිය (Wharfinger's receipt)

රේගුවට භාණ්ඩ භාරදුන් පසු එම භාණ්ඩ භාරගත් බව සඳහන් කරමින් රේගුව විසින් අපනයනකරුට නිකුත් කරන ලියවිල්ලකි.

## විදේශ වෙළෙඳාමේදී මුදල් ගෙවීම සඳහා යොදා ගන්නා ක්‍රම :

- ❖ ණයවර ලිපි විවෘත කිරීම මඟින්
- ❖ බැංකු අණකර මඟින්
- ❖ විද්‍යුත් ගෙවීම් ක්‍රම මඟින්

වර්තමානයේ අන්තර්ජාල සබඳතා උපයෝගී කරගෙන මුදල් ගෙවිය හැකි ක්‍රම වේ.

උදා: ණයකාඩ් (visa,master,american express)

- ❑ අන්තර්ජාල පෙරගෙවුම් කාඩ්පත්(internet pre-paid card)
- ❑ අන්තර්ජාල පෙරගෙවුම් පහසුකම්(internet pre-paid facility)

තමන්ගේ බැංකු ගිණුමක් මඟින් ගෙවීම් සිදු කරන අතර, ගෙවීම් සඳහා විධානය දීමට අන්තර්ජාල බැංකු පහසුකම්(Internet banking) භාවිතා කරයි.

- විද්‍යුත් ගෙවීම් සේවා ආයතන හරහා ගෙවීම
  (Electronic payment systems)

  උදා:www.paypal.com

  මෙම ක්‍රමයේදී පළමුව paypal පද්ධතිය තුළ ලියාපදිංචි වී බැංකු ගිණුම හෝ ණයපත් තොරතුරු paypal ආයතනයට ලබා දී paypal පද්ධතිය හරහා ගෙවීම් කළ හැකිය.මෙහිදී ගිණුම පිලිබඳ තොරතුරු බාහිර පාර්ශවයන්ට ලබාදීමක් සිදු නොවේ.